# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

| | | |
|---|---|---|
| ශ්‍රේණිය | - | 8 ශ්‍රේණිය |
| වාරය | - | තුන්වන වාරය |
| නිපුණතා මට්ටම | - | 5.2 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. |
| ක්‍රියාකාරකම | - | 5.2 ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හැර වෙනත් නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්මයක් හඳුනා ගනිමු. |





සැකසුම - එච්.ඒ.ඒ.ඩී.අඹේපිටිය මිය

මප/වත්/වත්තේගම බාලිකා මහ විදුහල,

වත්තේගම.

මෙහෙයවීම - නර්තන අංශය,

කලාප අධ්‍යාපන කාර්යාලය,

වත්තේගම.

උපදෙස් - මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුය.

# හැඳින්වීම

ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන්ට අයත් උඩරට කොහොඹා කංකාරිය, පහතරට දෙවොල්මඩුව සහ සබරගමු පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ අධ්‍යයනය කිරීම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වාම අපේක්ෂිතය.

ඒ ඒ ශ්‍රේණි අනුව ශාන්තිකර්ම පිළිබඳ විෂයය කරුණු ක්‍රමිකව පුළුල් වෙමින් විෂයය නිර්දේශය සැකසී ඇත. ඒ අනුව 6 ශ්‍රේණියේ දී දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම පිළිබඳ මූලික කරුණු ද, 7 ශ්‍රේණියේදී කොහොඹා කංකාරියද අධ්‍යනය කළ සිසු දරුවන් 8 ශ්‍රේණියේදී පහතරට දොවොල්මඩුව පැවැත්වීමේ හේතු, පුරාවෘතය, නර්තන, ගායන, වාදන, සැරසිලි, රංගවස්ත්‍රාභරණ ආදී තොරතුරු අධ්‍යනයට යොමු කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.



## පහතරට දෙවොල්මඩු ශාන්තිකර්මය

පහතරට සම්ප්‍රදාය තුළ දෙවියන් මුල්කොටගෙන පවත්වනු ලබන මඩු ශාන්තිකර්ම අතරින් “දෙවොල්මඩුව” ප්‍රධානත්වයක් ගනු ලබයි. දෙවොල් මඩුව ගමට සෙත්පතා කරන විට ගම්මඩුව ලෙස හඳුන්වන අතර, දකුණු සහ බස්නාහිර පළාත් තුළ ඇතැම් ප්‍රදේශයන්හි වාර්ෂිකව පවත්වනු ලබන සුවිශේෂී ශාන්තිකර්මයකි.

## දෙවොල්මඩුව පැවැත්වීමේ අරමුණු

- බෝවන රෝග හෙවත් වසංගත රෝගවලින් මිදීම.(පැපොල, සරම්ප, වසූරිය, කම්මුල්ගාය)
- ධන ධාන්‍ය, ගව මහීෂාදී, බවබෝග සම්පත් වැඩිදියුණු කර ගැනීම.
- ගමට, ප්‍රදේශයට, රටට පැමිණි ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තිය ලබා ගැනීම.
- අධ්‍යාපනික, පර්යේෂණ කටයුතු සඳහා.
- සංරක්ෂණය කර ගැනීම සඳහා.


# පුරාවෘත්ත කතාව

දකුණු ඉන්දියාවේ රජ කළ සේරමාන් නම් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝනකු මරා දමන ලෙසට රජු අණ කරන ලද හෙයින් හේවායන් ඌ පසුපස එළවා යන අවස්ථාවේදී ගෝනාගේ පය පැටලී අසළ පොකුණකට වැටී ඌ මරණයට පත්විය.

තමා මේ විපතට පත්වීමට හේතු වූ රජු කෙරෙහි වෛරයෙන් මියගිය ගෝනා එම පොකුණේම කුඩා මැඩියෙකු වී  ඉපදුනි.

දිනක් රජු පොකුණට පැමිණි අවස්ථාවක පිපී තිබුණු මහනෙල් මලක් කඩා එහි සුවඳ ආඝ්‍රාණය කරන විට පෙති අතර සිටි කුඩා මැඩියා නාසයට ඇතුළු වීම හේතුවෙන් රජුට දරුණු හිසරදයක් ඇති විය.  ඉන් රෝගීවූ රජුට කිසිඳු කිසිඳු ප්‍රතිකාරයකින් සුවයක් නොලද හෙයින් දිනක් රජු ඉතා රූමත් කාන්තාවක් සිහිනෙන් දුටුවේය.  පුරෝහිත බමුණාගෙන් ඒ පිළිබඳව විමසූ කළ සිහිනෙන් පෙනී සිටියේ පත්තිනි දේවිය බවත් රජුට ඇයගේ සාපයක් වැදී ඇති බවත් පැවසීය.

බුද්ධාගම ස්ථාපිත රටකට ගොස් පත්තිනි දේවියට පින් පැමිණ විය යුතු බව දන්වා සිටීය හෙයින් ඊට සුදුසුම රට ලංකාව බව තීරණය කළ රජු සීනිගමින් දිවයිනට පැමිණ රුවන්වැල්ලේදී ප්‍රථම දෙවොල් මඩුව කරවීය.  එදා පටන් රජුගේ හිසරදය දුරු වූ බැවින් ලක්දිව දෙවොල්මඩුව ආරම්භ වූ බවත් කියවේ.



# චාරිත්‍ර විධි

මෙහිදී පූර්ව චාරිත්‍ර සහ මඩු දින චාරිත්‍ර වශයෙන් පූජාවිධි සකස් වී තිබේ. එනම් දෙවොල්මඩුව පැවැත්වීමට පෙර දිනයන් සහ මඩුව පවත්වන දින කරනු ලබන චාරිත්‍ර විධීන්ය.

1. තොටමෙට යාම

මෙය දෙවොල්මඩු දින කරනු ලබන පළමු චාරිත්‍රයයි. සුදුසු පැන් තොටක් තෝරාගෙන කල් තබා ගොක් රැහැන් ඇද සීමාකොට, සියලු ඇදුරන් දිය නා, පිරිසිදු වී පේවීමයි.

2. මිල්ල කැපීම

දෙවොල්මඩුවේ චාරිත්‍රයක් වන ගිනි පෑගීමේ අවස්ථාව සඳහා යොදා ගන්නා මිල්ල ලී කැබැල්ලක් කපා සුදු පිරුවටයකින් ඔතා පෙරහැරින් වඩම්මවා ගෙනවිත් තොරණෙහි තැන්පත් කිරීමයි.

3. බිසෝකප සිටුවීම

වියත් 4 යි, අඟල් 4ක් පමණ දිග කෙසෙල් කඳක් ගොක්කොළ වලින් සරසා, මුදුනේ පොල් මලක් ගසා පත්තිනි තොරණ ඉදිරිපිට සිටුවීමයි.

4. කාලපන්දම් පූජාව

මුදනේ පුවක් මලක් ගසන ලද පුවක් කඳක් ගොප් කොළයෙන් සරසා, දෙවොල්මඩුව ඉදිරිපිට සිටුවා, ගොප්කොළ දංවැල් වලින් සරසන ලද කාලපන්දම් ගස දෙවොල් දෙවියන්ගේ නැවෙහි කුඹ ගස සංකේතවත් කරන බව කියවේ.

5. තොරණ යාගය

කඩතිරයකින් මුවා කොට ඇති පත්තිනි තොරණට කවි කියා අදාළ පද කොටස් නටා, කඩතිරය ඉවත් කොට තොරණ දැක්වීම

6. මල් යහන් පූජාව

සියලු මල් යහන්වලට සුවඳ දුම් අල්ලා, පද නටා මල් යහනට වඩින ලෙස සියලුම දෙවිවරුනට ආරාධනා කිරීම

7. කිරි ඉතිර වීම

ශාන්තිකර්ම භූමිය තුළම කිරි උතුරවා එම කිරි යහන්වලට සහ තොරණ වලට ඉස ආතුරයාගේ සහ පැමිණ සිටින්නන්ගේ හිස තැවරීම.

# නර්තන අංග

## 1. තෙල්මෙ නැටීම

**ශාන්තිකර්මයේ සියලුම නර්තන ශිල්පීන් සහභාගීවන ඉතාමත් අලංකාර නර්තනාංගයකි. පබළු ඇඳුම් කට්ටලයෙන් සැරසී තම දක්ෂතා ප්‍රදර්ශනය කරන ශිල්පීන් තෙල්මෙ පද 7ක් නර්තනය කරයි**



## 2. වාහල නැටීම

**මෙය දැඩිමුණ්ඩ දෙවියන් ඉදිරියේ කරනු ලබන ඒකල නර්තනයකි. දීර්ඝ සහ වේගවත් නර්තනයක් වන මෙහිදී ශිල්පියා අවේශයට පත්වේ.**



## 3. දෙවොල් නැටීම

දෙවොල් දෙවියන්ගේ ගොඩබැසීම සංකේතවත් කරන නාට්‍යමය ලක්ෂණ වලින් යුතු නර්තනයද මුසුවූ අලංකාර නර්තනයකි.



## 4. ගරා නැටීම

ශාන්තිකර්මය සිදුකිරීමේදී කිසියම් අත්වැරදීමක් සිදු වී නම් එවැනි වස්දොස් දුරු කිරීමට ගරා වෙස් මුහුණ පැළැඳ, සංවාද වලින් යුතුව කරනු ලබන නර්තනාංගයකි.

## 5. දොළහ පෙළපාලිය

පාලි 12කින් සමන්විත නාට්‍යමය ලක්ෂණ වලින් යුතු අංගයකි.

## 6. අඹ විදමන

නාට්‍යමය ලක්ෂණ වලින් යුතු නර්තනාංගයකි. හාස්‍ය උපදවන සංවාද වලින් යුක්තය. පත්තිනි දේවිය අඹෙන් උපන් කථා පුවත නිරූපණය කරයි.

## 7. මරා ඉපැද්දීම

මිහිරි ගායන සහ අභිනයෙන්ද පරිපූර්ණ වූ නාට්‍යමය අවස්ථාවකි.

## ගායනා අවස්ථා

- කඩතුරා කවි
- කෝල්මුර කවි
- මල්යහන් කවි
- නමස්කාර කවි
- යාදිනි

## වාදන අවස්ථා

- ❖ මඟුල් බෙර
- ❖ පිංබෙර



( මෙම අවස්ථාවන් සඳහා පහතරට බෙරය (යක් බෙරය) භාවිතා කෙරේ. මඩු ශාන්තිකර්මය පුරාම යක් බෙරය, තාලම්පට වාද්‍ය භාණ්ඩ ලෙස හඳුන්වා දිය හැකිය.)

# රංග වස්ත්‍රාභරණ

**දෙවොල්මඩු ශාන්තිකර්මය පැවැත්වීමේ දී ප්‍රධාන වශයෙන් ඇඳුම් කට්කටල කීපයක් භාවිත කරනු ලැබේ.**

1. තෙල්මේ ඇඳුම
2. දෙවොල් ඇඳුම

## තෙල්මේ ඇඳුම් කට්ටලය

**තෙල්මේ ඇඳුම් කට්ටලය නිර්මාණය කිරීමේදී අනෙක් ඇඳුම් කට්ටල වලට වඩා සුවිශේෂත්වයක් දැකිය හැකිය. පබළු වලින් ගෙත්තම් කර අලංකාර ලෙස නිර්මාණය කර තිබීම එහි විශේෂත්වයයි.**




## දොවොල් ඇඳුම් කට්ටලය



## දොවොල් ඇඳුම් කට්ටලයේ කොටස්

- මෙස් කලිසම
- සලඹු
- සේලය
- ඉණ හැඩය
- පච්චවඩම
- රැලි සාය
- දෙවොල් හැට්ටය
- දෙවොල් තොප්පිය
- කාඟුල් කුට්ටම

## බෙර ඇඳුම් කට්ටලය



- මෙස් කලිසම
- සුදු සේලය
- ඉණට ඔතන රෙද්ද ( සුදු)
- පච්චවඩම
- බන්දි වළලු
- ගිගිරි වළල්ල( දකුණු අතට)
- කරපටිය
- ජටාව ( සුදු රෙද්ද)
- කඩුක්කන්

## රංග සැරසිලි

**රංග භාණ්ඩ සැකසීමේදී ස්වභාවික අමු ද්‍රව්‍ය පමණක්ම යොදා ගැනීම සම්ප්‍රදායයි.**

- හබරළ කොළ
- ගොප් කොළ
- පොල් මල්
- පුවක් මල්
- කෙසෙල් ගස්
- පුවක් ගස්
- ලී කෝටු

## සැරසිලි අවස්ථා

- පූනාව පේ කිරීම
- පත්තිනි තොරණ
- කාල පන්දම් ගස
- තෙල්මේ තටුව
- බිසෝ කප





# ශාන්තිකර්ම පැවැත්වීමේදී සාමූහිකව කටයුතු කිරීමේ වටිනාකම

ගම් වැසියෝ ගමේ ශාන්තිකර්මයක් සිදු කරන විට එය පොදු කටයුත්තක් ලෙස සළකා ක්‍රියා කිරීමෙන් ප්‍රකට කළේ ඔවුන්ගේ " සාමූහිකත්වයයි"

ඔවුහු ශාන්තිකර්මයකට අවශ්‍ය ගොප් කොළ,ලී,පට්ටා,හබරළ කොළ,මල් සහ අනෙකුත් ද්‍රව්‍ය සපයා ගැනීමට සැරසිළි,යහන්,තොරණ් ඉදිකිරීමට තම ශක්ති ප්‍රමාණයෙ--න් දායක වූහ.එහිදී,

- වැඩිහිටි අවවාද අනුශාසනා පිළිපදිමින්
- එකී නායකත්වයට ගරු කරමින්
- කාර්යයන් බෙදා හදා ගනිමින්
- ස්ව කැමැත්තෙන්ම

කටයුතුවල නිරත වූහ.මෙසේ සාමූහිකත්වය තුළින් කටයුතු අලංකාරව ද , සාර්ථකව ද කරගත හැකි සේම අන්‍යෝන්‍ය සමගිය , එකමුතුබව ද වර්ධනය වේ.

ඒ අනුව සාමූහිකත්වයෙන් කටයුතු කිරීමේ අගය දැන හැඳින ,එකී ගුණාංගය තමා සතුකොට ගෙන අභියෝග ජය ගැනීමට අදිටන් කර ගනිමු.





